# අභයරාජකුමාර සූත්‍රය

(ම.නි.II, 92-98 පිට)

බුදුරජාණන් වහන්සේ අභය නමැති රාජකුමාරයා වෙනුවෙන් දේශනා කළ මෙම සූත්‍රයෙන් ඉතා නිවැරදි හා අර්ථවත් ලෙස තම වචන කථා කළ යුතු ආකාරය විස්තර වේ. ඒ අනුව අන් අය සමඟ කතාබහ කිරීමේ දී හා අන් අයට ධර්ම දේශනා කිරීමේ දී උන් වහන්සේ භාෂාව කෙසේ භාවිත කරන්නේ ද යන්න පැහැදිලි කර තිබේ. මෙම සූත්‍රය මැනැවින් ඉගෙන ගැනීමෙන් අප ද අන් අය සමඟ කටයුතු කිරීමේ දී තමාටත් අන් අයටත් මෙලොවටත් පරලොවටත් වැඩදයී ලෙස භාෂාව හැසිරවිය යුතු ආකාරය පිළිබඳ මනා අවබෝධයක් ලද හැකි වේ.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වෙළුවනාරාමයෙහි වැඩ වාසය කළහ. එකල්හි දිනක් අභය රාජකුමාරයා නිගණ්ඨ නාතපුත්ත වෙත එළඹ එකත් පසෙක හිඳ ගත්තේ ය. එකත් පසෙක හිඳගත් අභය රාජකුමාරයාට නිගණ්ඨ නාතපුත්ත උපදෙසක් දුන්නේ ය. එනම් '**ඔබ ශ්‍රමණ භවත් ගෞතමයන් කරා වාදයට එළඹෙන්න**' කියායි. තවද '**එවිට අභය රාජකුමාරයා මහත් ආනුභාව ඇති භාග්‍යවතුන් වහන්සේ සමඟ වාදයට එළඹියේ යැයි මහත් කීර්ති රාවයක් පැතිරෙන්නේ ය**' කියායි. එවිට අභය රාජකුමාරයා සඳහන් කළේ '**මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ සමඟ තමා කෙසේ නම් වාද කරන්නේ ද**' කියායි.

මෙහිදී බුදුරදුන් සමඟ උභතෝකෝටික ලෙස වාද කරන ආකාරය පිළිබඳව නිගණ්ඨ නාතපුත්ත තෙමේ අභය රාජකුමාරයාට උපදෙස් දුනි. ඒ අනුව ඔබ ගෞතමයන් වහන්සේ වෙත එළඹ මෙසේ අසන්න: '**වහන්ස, යම් වචනයක් අන්‍යයන්ට අප්‍රිය අමනාප වේ ද තථාගතයන් වහන්සේ එබඳු වචනය කියන්නාහු ද?**' මෙසේ විමසූ විට '**රාජකුමාරය, යම් වචනයක් අන්‍යයන්ට අප්‍රිය අමනාව වේ ද තථාගතයන් වහන්සේ එබඳු වචනයක් කියත් යැ**'යි පැවැසුව හොත් '**වහන්ස, එකල්හි පුහුදුන් පුද්ගලයන් හා ඔබ වහන්සේ අතර ඇති වෙනස කුමක් දැ**'යි ප්‍රතිප්‍රශ්න අසන්න. තවද මෙසේ ප්‍රශ්න ඇසූ විට '**රාජකුමාරය, යම් වචනයක් අන්‍යයන්ට අප්‍රිය අමනාප වේ නම් තථාගතයන් වහන්සේ එබඳු වචනය නොකියන්නා යැ**'යි පැවැසුව හොත් එවිට ඔබ '**වහන්ස, එසේ නම් ඔබ වහන්සේ දෙව්දත් අපායෙහි උපදින්නෙකි, දෙව්දත් නිරයෙහි උපදින්නෙකි. දෙව්දත් කල්පයක් දුගතියෙහි දුක් විඳින්නෙකි. දෙව්දත් පිළියම් නොකළ හැක්කෙකි යැයි ප්‍රකාශ කළ අතර එම ප්‍රකාශයෙන් දෙව්දත් නොසතුටු වූයේ කිපියේ යැ**'යි උභතෝකෝටික ලෙස ප්‍රතිප්‍රශ්න අසන්න. නිගණ්ඨ නාතපුත්ත අභයරාජකුමාරයට මෙසේ සඳහන් කොට තවදුරටත් ප්‍රකාශ කරන්නේ '**රාජකුමාරය, නුඹ විසින් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මෙසේ උභතෝකෝටික අයුරින් ප්‍රශ්න කරනා ලද්දේ වමාරන්නට හෝ ගිලින්නට නොහැකි වන්නේ ය**'.

නිගණ්ඨ නාතපුත්ත මෙසේ අභය රාජකුමාරයාට උපදෙස් දුන් කල්හි රාජකුමාරයා නිගණ්ඨ නාතපුත්තයන්ට පිළිවදන් දී හුනස්නෙන් නැගිට සකසා වැඳ පැදකුණු කොට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ සකසා වැඳ එකත් පසෙක හිඳ ගත්තේ ය. එම අවස්ථාවෙහි හිරු දෙස බලා අද වාද කරන්නට සුදුසු වේලාව නොවේ යැයි දැන පසුව වාද කරන අදහසින් පසු දින තම නිවසෙහි දනය සඳහා බුදුරදුන්ට ආරාධනා කළේ ය. භාග්‍යවතුන් වහන්සේ නිහඬතාවයෙන් එම දනය පිළිගත් අතර රාජකුමාරයාට බුදුරදුන්ට ගරුසරු දක්වා එතැනින් නික්ම තම නිවස බලා පිටත්විය.

පසුදින බුදුරජාණන් වහන්සේ අභය රාජකුමාරයාගේ නිවසෙහි දනයට වැඩම කළ අතර රාජකුමාරයා ප්‍රණීත ආහාර පානාදියෙන් බුදුරදුන්ට දන් පූජා කොට අවසන කුඩා අසුනක් ගෙන එකත් පසෙක හිඳ ගත්තේ ය. එවිට රාජකුමාරයා නිගණ්ඨ නාතපුත්තගේ උපදෙස් පරිදි බුදුරදුන් වෙතින් ප්‍රශ්න විචාළේ ය. ඒ අනුව "ස්වාමීනි, තථාගතයන් වහන්සේ අන්‍යයන්ට අප්‍රිය අමනාප වචන කථා කරන්නාහු ද?" යනුවෙනි. ඊට බුදුරදුන්ගේ පිළිතුර වූයේ "රාජකුමාරය එය එසේ ම යැයි ඒකාන්ත වශයෙන් නොපැවසිය හැකි ය" කියායි. මෙසේ සඳහන් කළ කල්හි අභය රාජකුමාරයා පැවැසුයේ "එසේ නම් මේ කරුණෙහි ලා නිගණ්ඨයෝ නැසුනාහු ය" යනුවෙනි. "රාජකුමාරය, මේ කරුණෙහි ලා නිගණ්ඨයෝ වැනසෙති" යැයි ඔබ පවසන්නේ කවර කරුණක් නිසාදැයි භාග්‍යවතුන් වහන්සේ පිළිවදන් දුන්හ.

මෙහිදී තමා නිගණ්ඨ නාතපුත්ත වෙත ගිය ආකාරයත් එහිදී ඔහු උභතෝකෝටික අයුරින් බුදුරදුන් වෙතින් ප්‍රශ්න ඇසීමට තමාව පෙළඹවූ ආකාරයත් අභය රාජකුමාරයා බුදුරදුන් හමුවෙහි ප්‍රකාශ කළේය.

මේ අවස්ථාවෙහි රාජකුමාරයා තමාගේ ඇකයෙහි කුඩා බිළිඳෙකු හොවා ගෙන සිටි අතර එම දරුවා ම උපමාවට ගනිමින් බුදුරජාණන් වහන්සේ ඔහු වෙතින් ප්‍රශ්න විචාළහ. "කුමාරය, ඔබගේ ඇකයෙහි සිටින දරුවා යම් විටෙක ඔබගේ හෝ කිරි මවගේ ප්‍රමාදයකදී ඔහුගේ උගුරෙහි කෝටු කැබැල්ලක් හෝ කැට කැබැල්ලක් උගුරේ සිර කර ගත හොත් එවිට ඔබ කුමක් කරන්නේ" ද යනුවෙනි. එවිට රාජකුමාරයා පිළිතුරු දුන්නේ "ස්වාමීනි, මම එවිට එය ඉවතට ඇද දමන්නෙමි. එකවර ම එය ඉවතට ඇද දැමිය නොහැකි විටෙක දරුවාගේ හිස වම් අතින් තදින් අල්ලා ගෙන දකුණතේ ඇඟිල්ලක් දරුවාගේ මුවට ඇතුළු කොට ලේ වැගිරෙද්දී වුව ද එය ඉවතට ගැනීමට කටයුතු කරන බවයි. තමා එසේ කරන්නේ තම දරුවාගේ ජීවිතය ගලවා ගැනීමට තමා තුළ අනුකම්පාවක් ආදරයක් කරුණාවක් පවතින නිසා බව ද වැඩි දුරටත් සඳහන් කළේ ය. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ සඳහන් කළේ ඔබ එසේ දරුවා කෙරෙහි කරුණාධ්‍යශයෙන් කටයුතු කරන්නාක් මෙන් තමන් වහන්සේ ද භාෂාව හැසිරවීමේ දී ආකාර හයකින් කටයුතු කරන බවයි. එනම්

1. තථාගතයන් වහන්සේ යම් වචනයක් අභූත යැයි අසත්‍ය යැයි අනර්ථකර යැයි ද එය අන් අයට අප්‍රිය යැයි දනී ද එවන් වචන නොකියති. (*යං තථාගතො වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථසංහිතං, සච පරෙසං අප්පියා අමනාපා, න තං තථාගතො වාචං භාසති.*)

2. තථාගතයන් වහන්සේ යම් වචනයක් භූත යැයි සත්‍ය යැයි අනර්ථකර යැයි ද එය අන් අයට අප්‍රිය යැයි දනී ද එවන් වචනය ද නොකියති. (*යම්පි තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං, සා ච පරෙසං අප්පියා අමනාපා, තම්පි තථාගතො වාචං න භාසති.*)

3. යම් වචනයක් භූත යයි ද සත්‍ය යයි ද අර්ථවත් යයි ද දනී ද එම වචනය අන්‍යයන්ට අප්‍රිය වූයේ නමුදු එය තථාගතයන් වහන්සේ අවස්ථානුකූලව පවසති. (*යඤ්ච තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං, සා ච පරෙසං අප්පියා අමනාපා, තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය*)

4. යම් වචනයක් අභූත යයි ද අසත්‍ය යයි ද අනර්ථකර යයි ද දනී ද එම වචනය අන් අයට ප්‍රිය මනාප වුව ද තථාගතයන් වහන්සේ නොපවසති. (*යං තථාගතො වාචං ජානාති අභූතං අතච්ඡං අනත්ථසංහිතං, සා ච පරෙසං පියා මනාපා, න තං තථාගතො වාචං භාසති.*)

5. යම් වචනයක් භූත යයි ද සත්‍ය යයි ද අනර්ථකර යයි ද තථාගතයන් වහන්සේ දනිත් ද එම වචනය ප්‍රියමනාප වුව ද නොපවසති. (*යම්පි තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අනත්ථසංහිතං, සා ච පරෙසං පියා මනාපා, තම්පි තථාගතො වාචං න භාසති.*)

6. යම් වචනයක් භූත යයි ද සත්‍ය යයි ද අර්ථකර යයි ද තථාගතයන් වහන්සේ දනිත් ද එම වචනය ප්‍රියමනාප වේ ද තථාගතයන් වහන්සේ එම වචනය සුදුසු කල්හි සත්ත්වයන් කෙරෙහි අනුකම්පාවෙන් පවසති. (*යඤ්ච ඛො තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං, සා ච පරෙසං පියා මනාපා, තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය... සත්තේසු අනුකම්පාති*)

| සත්‍ය (භූත-තච්ඡ) | අර්ථවත් (අත්ථසංහිත) | ප්‍රිය (පියා) | පැවැසීම |
|---|---|---|---|
| X | X | X | X |
| ✓ | X | X | X |
| ✓ | ✓ | X | ✓ (සුදුසු කල්හි) |
| X | X | ✓ | X |
| ✓ | X | ✓ | X |
| ✓ | ✓ | ✓ | ✓ (සුදුසු කල්හි) |

භාග්‍යවතුන් වහන්සේ මෙලෙස සඳහන් කළ කල්හි සතුටට පත් අභය රාජකුමාරයා බුදුරදුන් වෙතින් අසා සිටියේ **"ස්වාමීනි, ඔබ වහන්සේ වෙත යමෙකු ප්‍රශ්න ඇසීමට පැමිණි විට ඒ සඳහා කලින් සූදනම් වී ඊට**

**පිළිතුරු දෙනවා ද නැතහොත් ඒ ඒ වේලාවට, ඒ ඒ කරුණට ගැළපෙන පරිදි පිළිතුරු දෙනවා ද"** කියායි. මෙහිදී බුදුරජාණන් වහන්සේ ඊට පිළිතුරු වශයෙන් උපමාවක් ඉදිරිපත් කළහ. එනම් **"රජකුමරුනි, යම් විටෙක යමෙක් ඔබ වෙත පැමිණ රථයක අඟපසඟ විමසූ විට ඔබ ඊට පිළිතුරු දෙන්නේ කලින් සූදනම් ව ද? නැතිනම් අසන ප්‍රශ්නයට අනුරූපව එවලෙට වැටහෙන පිළිතුරක් ද?** කියායි. එවිට රාජකුමාරයා පිළිතුරු දුන්නේ **"ස්වාමීනි, රිය පැදවීමෙහි හැකියාව ඇති රථයක අඟපසඟ ගැන මනා වැටහීමක් ඇති මම අදාළ ප්‍රශ්නයට අවස්ථාචෝචිත ව පිළිතුරු සපයනවා"** කියායි.

මෙහිදී බුදුරජාණන් වහන්සේ සඳහන් කළේ රජකුමරා රථය ගැන ප්‍රශ්නවලට පිළිතුරු සපයන පරිදි ශ්‍රමණ බ්‍රාහ්මණාදි පණ්ඩිතයන් ඉදිරිපත් කරන ප්‍රශ්නවලට තැනට සුදුසු නුවණින් තථාගතයන් වහන්සේ පිළිතුරු සපයන බවයි. තවද තමන් වහන්සේ ලෝක ධර්මතා මැනැවින් තේරුම් ගත් තැනැත්තකු වශයෙන් ඒ ඒ ප්‍රශ්නවලට එවෙලේ ම පිළිතුරු දෙන බවයි. මෙහි දී සත්‍යබව, අර්ථ සහිතබව, ප්‍රියබව, නිසිකල් දන්නා බව පිළිබඳ උන්වහන්සේ අවධානය යොමු කරති. ඊට හේතුව ලෝසතුන් කෙරෙහි අනුකම්පා සහගත බව නිසයි.

*"යඤ්ච ඛො තථාගතො වාචං ජානාති භූතං තච්ඡං අත්ථසංහිතං සා ච පරෙසං පියා මනාපා. තත්‍ර කාලඤ්ඤූ තථාගතො හොති තස්සා වාචාය වෙය්‍යාකරණාය. තං කිස්ස හෙතු? අත්ථි රාජකුමාර තථාගතස්ස සත්තෙසු අනුකම්පාති"*

කායික, වාචසික, මානසික යන ත්‍රිවිධ සුචරිත අතර වාක් සුචරිතයට බුද්දහමෙහි ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. පංචසීලයෙහි අංගයක් වශයෙන් ද ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි (සම්මාවාචා) අංගයක් වශයෙන් ද සඳහන් එය වඩාත් ප්‍රකට ව ඇත. යමකුගේ වචනය යහපත් වීමට ඔහුගේ සංකල්ප හෙවත් සිතන ආකාරය යහපත් විය යුතු අතර සංකල්ප යහපත් වීමට යහපත් දැක්මක් හෙවත් සම්මාදිට්ඨිය අවශ්‍ය වේ. සම්මා දිට්ඨිය ලැබෙන්නේ කල්‍යාණ මිත්‍ර ඇසුරින් සද්ධර්ම ශ්‍රවණය කොට ඊට අනුරූපව නුවණින් මෙනෙහි කිරීමේ (යෝනිසෝ මනසිකාරයෙහි) ප්‍රතිඵල වශයෙනි. යහපත් වචනයක තිබිය යුතු අංග හතරකි.

එනම්

1. සත්‍ය වචන කීම (බොරුකීමෙන් වැළකීම = *මුසාවාද පටිවිරතො හොති*)
2. අනුන් නොබිඳවන වචන කීම (කේලාම්වලින් වැළකීම = *පිසුනාවාචා පටිවිරතො හොති*)
3. ප්‍රිය වචන භාවිතය (රළු පරුෂ වචනවලින් වැළකීම = *ඵරුසාවාචා පටිවිරතො හොති*)
4. අර්ථවත් වචන භාවිතය (හිස් වචනයෙන් වැළකීම = *සම්ඵපලාපා පටිවිරතො හොති*)

වශයෙනි.

යමකු තුළින් මිථ්‍යා හෙවත් වැරදි සහගත වචන හටගන්නේ මිථ්‍යා දෘෂ්ටිය පාදකව මිථ්‍යා සංකල්ප ඇති විටයි. එවිට අකුසල මූල සිතෙහි ක්‍රියාත්මක වන බැවිනි. බොරු කීමට ආසන්නත අකුසල මූලය ලෝභයයි. කේලාම් කීමට ආසන්නත අකුසල මූලය ද්වේෂයයි. පරුෂ වචන භාවිතයට ආසන්නත අකුසල මූලය ද්වේෂයයි. සම්පප්‍රලාප භාවිතයට ආසන්නත අකුසල මුලය මෝහයයි. ලෝභ ද්වේෂ මෝහ යන අකුසල මූල අඩු වූ පමණට මිථ්‍යා වචන ද ක්‍රමයෙන් අඩු වනු ඇත. ඒ සඳහා කිසියම් භාවනා කමටහනක් ඔස්සේ සිත සමාධිමත් කර ගැනීම අවශ්‍ය වේ. එවිට කාමච්ඡන්දදි නීවරණ පහ ව ගොස් සිත සමාධිමත් ව වචනය නිරායාසයෙන් ම සංවරයට පත් වේ. මේ අතර සත්‍යවාදී බව හෙවත් බොරු නොකියන බව සුවිශේෂී ගුණයක් වශයෙන් බුද්දහමින් අගය කොට තිබේ. බෝසත් දම් පුරණ බෝසත් උතුමෝ සත්‍යවාදී බව පාරමිතාවක් වශයෙන් සම්පූර්ණ කරති.

සමාජගත ජීවිතයෙහි දී පුද්ගලයන් අතර සුහදතාව ඇතිවීමට නිවැරදිව වචන භාවිතය බෙහෙවින් වැදගත් වන්නකි. එබැවින් යහපත් වචන භාවිතයට බුද්දහමින් අවධාරණය කර තිබේ. වරෙක භාග්‍යවතුන් වහන්සේ රාහුල මාහිමියන් වහන්සේට උපදෙස් දුන්නේ යළි යළිත් නුවණින් මෙනෙහි කොට වචන භාවිත කරන ලෙසයි (*පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වාචාය කම්මං කාතබ්බං*). මෙහිලා කණට මිහිරි වූ වචන කථා කිරීමත් (මධුභාණී) පමණ දැන අවශ්‍ය පමණට වචන භාවිත කිරීමත් (මිතභාණී) වැදගත් වේ. ඒ අතර වචන කථා කිරීමේ දී මෛත්‍රී සහගතව වචන (*මෙත්තාසහගතෙන වාචාය කම්මං කාතබ්බං*) භාවිතය බුද්දහමින් අගය කෙරේ. සුභාසිත වචනය මංගල කරුණක් වශයෙන් ද දක්වා තිබේ (*සුභාසිතා ච යා වාචා එතං මංගලමුත්තමං*). තමා යහපත් වචන කථා කරන අතර අන් අයගේ වචනයට සාවධානය ඇහුම්කම් දීම ද උසස් ගුණාංගයකි.

සුවචො නමින් දක්වා ඇති මෙය ධර්ම මාර්ගයෙහි ආරම්භයෙහි ම තිබිය යුතු මූලික ගුණාංගයක් වශයෙන් දක්වා තිබේ.

මේඝිය සූත්‍රයට අනුව කල්‍යාණමිත්‍රයන් සහාය කොට ඇති කල්‍යාණමිත්‍රයන්ට නැමුණු නිවන් මග ගමන් ගන්නා ශ්‍රාවකයකු විසින් කළ යුතු ඒකාන්තයෙන් නිවන පිණිස විරාගය නිරෝධය උපසමය පිණිස හේතුවන දැහැමි දැහැමි කථා දහයක් දක්වා තිබේ.

ඒවා නම්

1. අල්පේච්ඡතාව පිළිබඳ කථා (*අප්පිච්චකථා*)
2. ලද දෙයින් තෘප්තිමත් බව පිණිස කථා (*සන්තුට්ඨිකථා*)
3. දැහැමි විවේකය පිළිබඳ (*පවිවේකකථා*)
4. කෙළෙස් හා නොගැටීම පිළිබඳ කථා (අසංසට්ඨකථා)
5. වීර්ය පිළිබඳ කථා (*විරියාරම්භකථා*)
6. සීලය පිළිබඳ කථා (*සීලකථා)*
7. සමාධිය පිළිබඳ කථා (*සමාධිකථා*)
8. ප්‍රඥාව පිළිබඳ කථා (*පඤ්ඤකථා*)
9. කෙළෙසුන්ගෙන් මිදීම පිළිබඳ කථා (*විමුත්තිකථා*)
10. විමුක්තියට අදාළ ඥානය පිළිබඳ කථා (*විමුත්තිඤාණදස්සනකථා*)

(මේඝිය සුත්ත, ඛු.නි.1, 200 පිට)

මේ අතර රාජකථා, චොරකථා ආදියෙන් වළකින ලෙස ද භාග්‍යවතුන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් අනුශාසනා කරති. මෙබඳු කථාවලින් යුතු වූ පමණට අපගේ සිත, කය, වචනය යන තුන් දෙර ම අසංවරයට පත් ව සිතෙහි සතුට සැනසුම සහනය ගිලිහී යනු දක්නට ලැබේ. එබැවින් අනර්ථසහගත නිසරු වචන දහසකට වඩා අර්ථවත් උපසමය පිණිස හේතුවන එක වචනය වුව ද උතුම් බව බුදුරජාණන් වහන්සේ දේශනා කරති (*සහස්සම්පි චෙ වාචා අනත්ථපදසංහිතා ඒකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති...* ධම්මපද). එබඳු අර්ථවත් වචන කථා කිරීමට අපව උනන්දු කරවති.

සමාජගත ජීවිතයෙහි පුද්ගලයන් හා කටයුතු කිරීමේ දී අප බොහෝ විට අප්‍රසාදයට පත් වන්නේ භාෂා භාවිතයෙහි පවත්නා දුර්වලතා හේතුවෙනි. පමණ දන සිහිනුවණින් වචන භාවිතයෙන් අන් අයගේ සිත රිදවීම්වලින් අත්මිදී අන් අයගේ ගෞරවය හා විශ්වාසය දිනා ගෙන කටයුතු කිරීමට අවස්ථාව උදවේ. එය තමාටත් අනුන්ටත් මෙලොවටත් පරලොවටත් මහත් වූ යහපතක් උදකරලයි.

යමකු බෙහෙවින් කථා කළ පමණින් පණ්ඩිතයකු නොවන (*න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති*) අතර කෙනෙකුගේ ප්‍රඥාව බැලිය හැක්කේ ද ඔහු සමග සාකච්ඡා කිරීමෙන් (*සාකච්ඡාය පඤ්ඤ වේදිතබ්බො*) බව බුදුදහම අවධාරණය කරයි.

ප්‍රථමධ්‍යානයට පත් ව ක්‍රමයෙන් දෙවන ධ්‍යානයට පිවිසීමත් සමග ක්‍රමයෙන් විචිකිච්ඡා නීවරණය දුරුවීම් වශයෙන් වචීසංඛාර හෙවත් සිතින් කථා කරන ස්වභාවය ද දුරුව යයි. සෝවාන්වීමත් සමග ශාශ්වත උච්ඡේද දෘෂ්ටීන්ට වැටෙන කථාවලින් මිදෙන අතර වචනයේ සැහෙන සංවරයක් ද ඇති වේ. විචිකිච්ඡා හෙවත් සැකය යන සංයෝජනය සම්පූර්ණයෙන් ම දුරුවීම් වශයෙන් '**විගතකථංකථී**' හෙවත් දෘෂ්ටීන් සහිත කථාවන් ඇසුරින් ප්‍රශ්න ඇසීම ද නිමාවට පත් වේ.

කාය, වාග්, මනෝ සුචරිත යන ත්‍රිවිධ සුචරිත අතර වචී සුචරිත ද බුදුදහමින් අවධාරණය කර තිබෙනු පෙනේ. ඒ සඳහා ඉන්ද්‍රිය සංවරය මෙන් ම යෝනිසෝ මනසිකාරය ද අවශ්‍ය වේ. වචනයේ නිරවද්‍යතාව පංචශීලයෙන් මෙන් ම ආජීවක අට්ඨමක සීලයෙන් ද අවධාරණය කර තිබේ. ප්‍රිය බව, ගරුභාවනීය බව, වචනයෙහි ඇදහිය හැකි බව යනාදී ගුරුවරයකු තුළ තිබිය යුතු ගුණාංග පැහැදිලි කිරීමේ දී වචනයේ සංවරය ද එක් අංගයක් වශයෙන් දක්වා ඇත. විශේෂයෙන් **යමකුට ධම්මකථිකයකු බව ද පත්විය හැක්කේ දුකත් දුකින් නිදහස්වීම පිළිබඳවත් දේශනා කිරීමෙන්** බව ද බුදුදහම පෙන්වා දෙයි.

මෙලොව උපත ලද භාග්‍යසම්පන්න බුද්ධිමත් මනුෂ්‍යයකු විසින් වැඩිය යුතු උසස් ම ගුණාංග ලෙස භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ සමථ විදර්ශනා දෙකයි (අභිඤ්ඤ සුත්ත, අං.නි.2, 474 පිට). ලෝකය හා දුක පිළිබඳ මනා වැටහීමකින් යුතුව සීලයක පිහිටා සමථ විදර්ශනා භාවනාවන්හි යෙදීමෙන් සන්තාගත සියලු දුක්වලින් නිදහස්වීමට අවස්ථාව උදාවේ. එමගින් එක් පසෙකින් තමාගේ වචනයෙහි උපරිම සංවරයක් ඇති කර ගැනීමටත් අන් අයගේ නොසරුප් වචනයන්ට මැදහත් ව මුහුණදීමටත් අවස්ථාව උදාවේ. සමථ භාවනාව තුළින් තමාගේ වචන භාවිතය සංවර වන අතර විදර්ශනා භාවනාවෙන් වචනයේ අනිත්‍යතාව මෙනෙහි කොට උපේක්ෂාවට පත්වීමේ හැකියාව උදාවේ. කනට පතිත වන වචනය යනු කණ, ශබ්දය, සෝත විඤ්ඤාණ තුනේ එක්වීමේ ප්‍රතිඵලයකි. එය පෙර නොතිබී හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වන තත්ත්වයකි. මේ බව මැනැවින් තේරුම් ගත හොත් බාහිර පුද්ගලයකු හෝ ද්‍රව්‍යයක් මත සිත නොපිහිටයි. දුකින් නිදහස්වීමේ මාවත මෙයයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ තමන් වහන්සේ යුදපිටියට බැසි ඇතකු මෙන් අන් අයගේ නොසරුප් වචන නමැති කඩු පහර ඉවසා දරා සිටින බවයි. (*අහං නාගො'ව සංගාමෙ චාපාතො පතිතං සරං අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලො හි බහුජ්ජනො*) හැම විටම සමාජයෙන් යහපත් වචන නොලැබිය හැක්කකි. ඊට හේතුව බොහෝ දෙනා දුසිල්වත් අය බව දන්නා බැවිනි. එනිසා අප කළ යුත්තේ එක් අතකින් අපගේ වචනය යහපත් කර ගන්නා ගමන් අන් අයගේ වචනයට සාවධානව සක්‍රියව ඇහුම්කම් දීමේ කුසලතාව දියුණු කර ගනිමින් ප්‍රිය වචනයට මෙන් ම අප්‍රිය වචනයට ද මුහුණ දිය හැකි අකම්පිත මනසක් සාද ගැනීමයි. බුදුදහමින් අපට මග පෙන්වන්නේ මේ සඳහා නොපමාව කටයුතු කරන ලෙසයි.

ඔබ සැමට තෙරුවන් සරණයි !

සම්බුද්ධාලෝක බෞද්ධ විහාරය, මොරිනෝ වැලි, රිවර්සයිඩ්, කැලිෆෝනියා, එක්සත් ජනපදය

# 2019 වස් සමයෙහි ධර්මදේශනාව

(බු.ව.2563) 09/21/2019